# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2086/15 - 2018 අගෝස්තු මස 29 වැනි බදාදා - 2018.08.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු මැද පළාත

උතුරු මැද පළාතේ ආණ්ඩුකාරවර මාරප්පුලිගේ ජයසිංහ වන මා විසින් 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතෙහි 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 වන අධිකාරිය මහා නගර සභා ආඥාපනතේ 289(1) වගන්තියෙන් විෂය භාර අමාත්‍යවරයාට හිමි බලතල ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව සාදන ලද මහා නගර සභා නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති සහ සභිකයින් සඳහා වන පහත සඳහන් දීමනාවලට නියෝග මෙයින් පනවනු ලැබේ. මෙම නියෝග 2018 ජූලි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු වේ.

**මාරප්පුලිගේ ජයසිංහ,**
උතුරු මැද පළාතේ ආණ්ඩුකාරවර,
උතුරු මැද පළාත.

2018 ජූනි මස 13 වැනි දින,
උතුරු මැද පළාත,
ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

**නියෝග**

1. මහා නගර සභා නගරාධිපතිවරුන්ට මහා නගර සභාවේ රාජකාරි ගමන් සඳහා ඉන්ධන සීමා නියම කිරීම.

    I. මහා නගර සභාවේ වාහන යොදවා ගන්නේ නම් සහ එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකින් සංයුක්ත මහා නගර සභාවක් සඳහා මසකට ඉන්ධන ඩීසල් ලීටර් 400 ට නොවැඩි ප්‍රමාණයක් ; හෝ

    II. මහා නගර සභාවේ වාහනයක් නොමැතිවන අවස්ථාවක ඉහත ඉන්ධන සඳහා වැය සීමාව යටතේ විෂයභාර අමාත්‍යවරයාගේ අවසරය ලබාගෙන පෞද්ගලික වාහන සඳහා සභා අරමුදලින් වැය දැරිය හැකිය.

2. ගමන් වියදම් හා සංයුක්ත දීමනා :

    I. මහා නගර සභා නගරාධිපතිවරුන් සඳහා ආයතන සංග්‍රහයේ විධිවිධානවලට යටත්ව සම්පූර්ණ දිනකට රුපියල් 500.00 කට නොවැඩි සංයුක්ත දීමනාවක් ගෙවිය හැකි අතර, මෙම දීමනාව ලබා ගත හැක්කේ මසකට දින 10 ක උපරිමයකට යටත්ව පමණි.

    II. සංයුක්ත දීමනාව ගෙවනු ලබන්නේ මහා නගර සභා ප්‍රදේශයෙන් පිට රාජකාරි ගමන් බිමන් සඳහා පමණි. ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව මෙම ගෙවීම් කළ යුතු ය.


1A - PG 4187 — 187 (2018/08)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

III. මහා නගර සභා බල ප්‍රදේශය තුළ කරනු ලබන ගමන්බිමන් සඳහා මෙම දීමනා ගෙවනු නොලැබේ.

IV. ඉහත සඳහන් පරිදි ගමන් ගාස්තු හා සංයුක්ත දීමනා ලබා ගැනීමට හැකි වන්නේ අදාළ මහා නගර සභාව සම්බන්ධව රාජකාරි ඉටු කිරීම සඳහා ගිය ගමන් බිමන් සඳහා පමණි. මහා නගර සභාවේ කටයුතුවලට අදාළ උත්සවයක්, සම්මන්ත්‍රණයක් හෝ රැස්වීමක් සඳහා නිල වශයෙන් ආරාධනාවක් ලැබුණු අවස්ථාවක් හැර සම්මන්ත්‍රණයක් හෝ රැස්වීමකට සහභාගිවීමට යාම වෙනුවෙන් මහා නගර සභා අරමුදලින් ගමන් ගාස්තු හෝ සංයුක්ත දීමනාවක් හෝ ලබා ගැනීමට හිමිකම් නැත.

3. සංග්‍රහ දීමනා :

I. මහා නගර සභා නගරාධිපතිවරුන් වෙත සංග්‍රහ දීමනා වශයෙන් මාසිකව රුපියල් 3000.00 ක දීමනාවක් සභා අරමුදලින් වියදම් කළ හැකි ය. ඒ සඳහා වැය විෂය ඉදිරිපත් කළ යුතු වේ.

II. මහා නගර සභා නියෝජ්‍ය නගරාධිපතිවරුන් වෙත සංග්‍රහ දීමනා වශයෙන් මාසිකව රුපියල් 750.00 ක දීමනාවක් සභා අරමුදලින් වියදම් කළ හැකිය. ඒ සඳහා වැය විෂය ඉදිරිපත් කළ යුතු වේ.

III. මහා නගර සභාවේ සභා රැස්වීම් හා කමිටු රැස්වීම්වලට සහභාගිවන සභිකවරුන්ට සංග්‍රහ කිරීම සඳහා සහභාගිවන එක් සභිකවරයෙකු එක් රැස්වීමකට රුපියල් 100.00 ක උපරිමයකට යටත්ව සභා අරමුදලින් වියදම් දැරිය හැකිය.

4. දුරකථන දීමනා :

1. නගරාධිපතිවරයාට හා නියෝජ්‍ය නගරාධිපතිවරයාට නිවාස දුරකථනය වෙනුවෙන් සභා අරමුදලින් පහත සඳහන් පරිදි දීමනා ලබා ගැනීමට අවසර දෙනු ලැබේ.

I. නගරාධිපතිවරයාට මාසිකව : රුපියල් 4000.00

II. නියෝජ්‍ය නගරාධිපතිවරයාට මාසිකව : රුපියල් 2500.00

5. සභා රැස්වීම් හා කමිටු රැස්වීම් සඳහා පැමිණීමේ දීමනා :

I. නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති හා සභිකයින් එක් රැස්වීමකට පැමිණීම වෙනුවෙන් රුපියල් 500.00 දීමනාවක් සඳහා සභා අරමුදලින් වැය දැරිය හැකිය.

6. මහා නගර සභා නගරාධිපතිවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩල දීමනා :

I. මහා නගර සභාවේ නගරාධිපතිවරයාට පෞද්ගලික ලේකම්වරයෙකු පත්කරගත හැකි අතර ඔහුට දීමනා වශයෙන් රුපියල් 15000.00 ක උපරිමයකට යටත්ව සභා අරමුදලින් වියදම් දැරිය හැකිය.

II. මහා නගර සභාවේ නගරාධිපතිවරයාට මහජන සම්බන්ධීකාරකවරයෙකු පත්කරගත හැකි අතර ඔහුට දීමනා වශයෙන් රුපියල් 10000.00 ක උපරිමයකට යටත්ව සභා අරමුදලින් වියදම් දැරිය හැකිය.

09 - 256/1

---

## උතුරු මැද පළාත

### නිවේදනයයි

උතුරු මැද පළාතේ ආණ්ඩුකාරවර මාරප්පුලිගේ ජයසිංහ වන මා විසින් 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතෙහි 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 184(1) (ඇ)(ඉ)(ඊ) වගන්තියෙන් විෂයභාර අමාත්‍යවරයාට හිමි බලතල ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව සාදන ලද ප්‍රාදේශීය සභා සභාපති, උපසභාපති සහ සභිකයින් සඳහා වන පහත සඳහන් දීමනාවලට රීති මෙයින් පනවනු ලැබේ. මෙම රීති 2018 ජූලි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු වේ.

**මාරප්පුලිගේ ජයසිංහ,**
උතුරු මැද පළාතේ ආණ්ඩුකාරවර,
උතුරු මැද පළාත.

2018 ජුනි මස 13 වැනි දින,
උතුරු මැද පළාත,
ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

**රීති**

1. ප්‍රාදේශීය සභා සභාපතිවරුන්ට ප්‍රාදේශීය සභාවේ රාජකාරි ගමන් සඳහා ඉන්ධන සීමා නියම කිරීම.

I. ප්‍රාදේශීය සභාවේ වාහන යොදවා ගන්නේ නම් සහ එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකින් සංයුක්ත ප්‍රාදේශීය සභාවක් සඳහා මසකට ඉන්ධන ඩීසල් ලීටර් 400 ට නොවැඩි ප්‍රමාණයක් ; හෝ

II. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකකින් සංයුක්ත ප්‍රාදේශීය සභාවක් සඳහා මසකට ඉන්ධන ඩීසල් ලීටර් 500 ට නොවැඩි ප්‍රමාණයක් සඳහා වියදම් දැරිය හැකිය.

III. ප්‍රාදේශීය සභාවේ වාහනයක් නොමැතිවන අවස්ථාවක ඉහත ඉන්ධන සඳහා වැය සීමාව යටතේ පළාත් පාලන කොමසාරිස්ගේ අවසරය ලබාගෙන පෞද්ගලික වාහන සඳහා සභා අරමුදලින් වැය දැරිය හැකිය.

2. ගමන් වියදම් හා සංයුක්ත දීමනා :

I. ප්‍රාදේශීය සභා සභාපතිවරුන් සඳහා ආයතන සංග්‍රහයේ විධිවිධානවලට යටත්ව සම්පූර්ණ දිනකට රුපියල් 500.00 කට නොවැඩි සංයුක්ත දීමනාවක් ගෙවිය හැකි අතර, මෙම දීමනාව ලබා ගත හැක්කේ මසකට දින 10 ක උපරිමයකට යටත්ව පමණි.

II. සංයුක්ත දීමනාව ගෙවනු ලබන්නේ ප්‍රාදේශීය සභා ප්‍රදේශයෙන් පිට රාජකාරි ගමන් බිමන් සඳහා පමණි. ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව මෙම ගෙවීම් කළ යුතු ය.

III. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කරනු ලබන ගමන්බිමන් සඳහා මෙම දීමනා ගෙවනු නොලැබේ.

IV. ඉහත සඳහන් පරිදි ගමන් ගාස්තු හා සංයුක්ත දීමනා ලබා ගැනීමට හැකි වන්නේ අදාළ ප්‍රාදේශීය සභාව සම්බන්ධව රාජකාරි ඉටු කිරීම සඳහා ගිය ගමන් බිමන් සඳහා පමණි. ප්‍රාදේශීය සභාවේ කටයුතුවලට අදාළ උත්සවයක්, සම්මන්ත්‍රණයක් හෝ රැස්වීමක් සඳහා නිල වශයෙන් ආරාධනාවක් ලැබුණු අවස්ථාවක් හැර සම්මන්ත්‍රණයක් හෝ රැස්වීමකට සහභාගිවීමට යාම වෙනුවෙන් ප්‍රාදේශීය සභා අරමුදලින් ගමන් ගාස්තු හෝ සංයුක්ත දීමනාවක් හෝ ලබා ගැනීමට හිමිකම් නැත.

3. සංග්‍රහ දීමනා :

I. ප්‍රාදේශීය සභා සභාපතිවරුන් වෙත සංග්‍රහ දීමනා වශයෙන් මාසිකව රුපියල් 2,000.00 ක දීමනාවක් සභා අරමුදලින් වියදම් කළ හැකි ය. ඒ සඳහා වැය විෂය ඉදිරිපත් කළ යුතු වේ.

II. ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීම් හා කමිටු රැස්වීම්වලට සහභාගිවන සභිකවරුන්ට සංග්‍රහ කිරීම සඳහා සහභාගිවන එක් සභිකවරයෙකු එක් රැස්වීමකට රුපියල් 100.00 ක උපරිමයකට යටත්ව සභා අරමුදලින් වියදම් දැරිය හැකිය.

4. දුරකථන දීමනා :

1. සභාපතිවරයාට හා උපසභාපතිවරයාට නිවාස දුරකථනය වෙනුවෙන් සභා අරමුදලින් පහත සඳහන් පරිදි දීමනා ලබා ගැනීමට අවසර දෙනු ලැබේ.

I. සභාපතිවරයාට මාසිකව : රුපියල් 3,000.00

II. උපසභාපතිවරයාට මාසිකව : රුපියල් 2,000.00

5. සභා රැස්වීම් හා කමිටු රැස්වීම් සඳහා පැමිණීමේ දීමනා :

I. සභාපති, උපසභාපති හා සභිකයින් එක් රැස්වීමකට පැමිණීම වෙනුවෙන් රුපියල් 500.00 දීමනාවක් සඳහා සභා අරමුදලින් වැය දැරිය හැකිය.

6. ප්‍රාදේශීය සභා සභාපතිවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩල දීමනා :

I. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට පෞද්ගලික ලේකම්වරයෙකු පත්කරගත හැකි අතර ඔහුට දීමනා වශයෙන් රුපියල් 7,500.00 ක උපරිමයකට යටත්ව සභා අරමුදලින් වියදම් දැරිය හැකිය.

09 - 256/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.